# මල සාම්පල එකතුව පිළිබඳ තොරතුරු පත්‍රිකාව

Sinhala

- **එකතු කිරීමෙන් පසු, නියම කරන ලද එකතු කිරීමේ ස්ථාන වෙත පැය 24 ක්ඇතුළතමල සාම්පලය ඉදිරිපත් කරන්න**.කරුණාකර ස්ථාන හා විවෘත වන වේලාවන් පිළිබඳව දැන ගැනීමට https://www.coronavirus.gov.hk/eng/early-testing.html වෙත යොමු වන්න.
- ළමයින්ට හෝ අවශ්‍යතා ඇති වෙනත් පුද්ගලයින්ගේ මල එකතු කිරීම සඳහා, මල පහ කිරීම සඳහා ඇති බඳුන් හෝ ඩයපර් භාවිතා කළ හැකිය.

## පියවර 1 සකස් කිරීම

1. රසායනාගාර ආකෘතිය පුරවන්න.
2. මල එකතු කිරීම සඳහා අයිතම සකස් කරන්න. උදා. පිරිසිදු කසළ ඉවත් කරන බෑගයක් හෝ ඩයපර්.
3. කසළ දමන බෑගය ගම් ටේප් පටියක් ආධාරයෙන් වැසිකිළි බඳුනේ සවි කර ආධාරක පියන පහළට දමන්න. නැතහොත් ඩයපරය භාවිත කරන්න.







## පියවර 2 සාම්පලඑකතුව

4. රටකජු ඇට 2 ක තරම් මල සාම්පල ප්‍රමාණයක් එකතු කිරීම සඳහා මල එකතු කිරීමේ හැන්ද භාවිත කරන්න. ප්‍රතිඵලයට බලපාන අපද්‍රව්‍ය වන මුත්‍රා, වැසිකිළි ජලය, ටිෂූ කඩදාසි සහ වෙනත් දේ මල සාම්පල සමග සම්බන්ධ වීම වළක්වා ගැනීමට උත්සාහ කරන්න
5. සාම්පල බෝතලයේ පියන තදින් වසා දමන්න. කාන්දුවීමක් සිදු නොවන බවට සහතික වන්න.
6. සාම්පල බෝතලයේ මතුපිට ටිෂූ කඩදාසියකින් පිරිසිදු කරන්න. පිරිසිදු කිරීම සඳහා බෝතල් මතුපිට ඇල්කොහොල් භාවිතා නොකරන්න.




## පියවර 3 සාම්පල ඉදිරිපත් කිරීම

7. සාම්පල බෝතලය පළමු සාම්පල බෑගයට දමන්න දෑත් හොඳින් පිරිසිදු කරන්න, ඉන්පසු පළමු සාම්පල බෑගය ප්‍රවේශමෙන් මුද්‍රා තබන්න.
8. සාම්පල බෝතලය සහිත පළමු සාම්පල බෑගය, දෙවන සාම්පල බෑගයට (සාම්පල ගෙන යන බෑගය) දමා ප්‍රවේශමෙන් මුද්‍රා තබන්න. සම්පූර්ණ කරන ලද රසායනාගාර ආකෘති පත්‍රය පුරවා සාම්පල රැගෙන යන මල්ලෙහි විවෘත කොටසේ තබන්න.
9. පාවිච්චි කළ සියලුම භාණ්ඩ කසළ මල්ලකට දමා, නිසි ලෙස ආවරණය කළ කසළ බඳුනට ඉවත් කරන්න. පසුව සබන් හා වතුර යොදා ඔබේ දෑත් හොඳින් පිරිසිදු කරන්න.








二零二一年一月製作
Produced in January 2021